## ආගමක් හෝ විශ්වාසයක් දැරීමට ඇති නිදහස උදෙසා සමාව දීම, ඉවසීම , විශ්වාසය යනාදි මානුෂීය ගුණාංග

මනුෂ්‍ය සත්වයා තුල භෞතික හෙවත් ලෞකික ජීවිතයක් මෙන්ම අධ්‍යාත්මික දිවියක් ද පවතී. මේ අධ්‍යාත්මික ජීවිතයට ඔහු පෝෂණය කරනුයේ ආගම තුළිනි.ආගම වනාහි එක් සංස්කෘතික අංගයක්ද වේ. ආගම ඇදහීම යනු යම් කිසි විශ්වාසයක් දැරීමකි.ලෞකික ජීවිතය මිනිසා පෝෂණය කරනුයේ මිල මුදල් , යානවාහන , ධනය , බලය ,තාන්න මාන්න යන භෞතික වස්තූන් තුළිනි . අධ්‍යාත්මික ජීවිතය පෝෂණය කරනුයේ ආගමක් හෝ යම් කිසි විශ්වාසයක් දැරීමේදී ගනු ලබන ඉගැන්වීම් තුලිනි . ඈත අතීතයේ පටන් අප විශ්වය තුල විවිධාකාර වූ ආගම් හා විශ්වාසයන් පැවතුණි. මේවා සමහරක් අද වන විටද වෙනස් වීම් වලට භාජනය වෙමින් ශේෂව පවතී.උදාහරණයක් ලෙස අතීතයේ මිනිසුන් ගස් ගල් වලට දේවත්වයක් ආරූඪ කරගෙන ඒවාට වැඳුම් පිදුම් කරනු ලැබුවේය. අද සමාජයේ එය පිළිම වලට වන්දනා මාන කරති.

ආගම යන්න කුමක්ද යන්න සලකා බැලීමේදී පැහැදිලි අර්ථකථනයක් ඉදිරිපත් කළ නොහැකි වුවද එඩ්වඩ් නොබෙක් විසින් ආගම අර්ථ දක්වනුයේ " අදහස් , විශ්වාසය , ආකල්ප හා අධිස්වාභාවික බලවේගයන්ගේ ක්‍රියාදාමයක් " ලෙසය. මේ අර්ථකතනය තුලින් පෙනී යනුයේ ආගම වනාහි යම්කිසි විශ්වාසයක් දැරීම ලෙස පැහැදිලි කරගත හැකිය නිදසුනක් ලෙස අප අසල් වැසි රාජ්‍යය වන ඉන්දියාවේ ජනතාව ආගම ඇදහීම හා ඔවුන් ගේ මිත්‍යා දෘෂ්ඨික අදහස් ගෙන හැර දැක්විය හැක. එබැවින් එයින් පෙනියනුයේ ලොව විවිධ සමාජ වල විවිධාකාර වු ආගමික විශ්වාස හා පුද පූජා පවත්වනු ලබන බවත් තම දිවිය සැපවත් හා නිරෝගි කර ගැනීමට හා අභියෝග වලින් හා කරදර වලින් මිදීමේ අරමුණනින් ආගම ඇදහිම සිදු කරනු ලබන බවයි. කෙසේ වූවත් සීයයට සීයක් නොවුවත් සීයට එකක් හෝ අඩුවෙන් ලෝකේ සිටින සෑම මනුෂයෙක්ම පහේ යම්කිසි ආගමක් හෝ විශ්වාසයක් දරන්නෝ වෙති. ආගමක් හෝ විශ්වාසයක් දැරීම ගැන විමසා බැලීමට ප්‍රථම දැනට ප්‍රසිද්ධ ව පවතින ආගම් 04ක් පදනම ගැන විමසා බැලිමට මම අදහස් කරමි.

ප්‍රථමයෙන් බුදු දහම ගැන විමසා බලමු. බුදුදහම හෝ බුදු සමය වනාහි බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ ධර්මයන් පාදක කොට ගෙන ගොඩ් නැගුණු දර්ශනයකි. උන්වහන්සේ දේශනා කල ආකාරයට මිනිසා චතුර්යී සත්‍ය අවබෝධ කර නොගත්තොත් මිනිසාට සසර තුල ගමන් මාර්ගය ඉතා දිගුවන බවයි. එමෙන්ම මනුෂ්‍ය සිත දමනය කරවීම සදහා මිනිසා මෙහෙය වීමට සිල්පද සිල්පද ආරාක්ශා කරවීමට යොමු කරවයි. බුදුදහමේ මූලික හරය වන අනිත්‍ය , දුක්ඛ , අනාත්ම යන පටිචර සමුප්පාදය පිලිබඳ අවබෝධ කරගෙන ඒ අනුව ජීවත් වෙමින් ඉවසීම සමාවදිම හා විශ්වාසය යන මානුශීය ගුණංග ඇති පුද්ගලයෙක් විය හැකි බව උගන්වයි. බෞද්ධ දර්ශනය අනුගමනය කරන්නා හට බුදු රජාණන් වහන්සේ දේශනා කරනුයේ කොපමණ කුසුලදම් වඩන්න කියාය .

කිතු දහමට ගෙන කතා කිරිමෙදි එය වනාහි ජේසුස් වහන්සේගේ ජීවිතය හා ඉගැන්වීම් මටහ් පදනම් වන එකම දෙවි කෙනෙක් ගැන විශ්වාසය දරන්නා වූ දහමකි. ලොව පුරා බිලියන 2.4ක් පමණ අනුගාමිකයන් පිරිසක් අනුගමනය කරන දහම මෙය වන අතර මෙහි මූලික හර එකිනෙකාට සමාව දීමයි. ජේසුස් වහන්සේ මනුෂ්‍යයා පාපයෙන් ගලවාගැනීමට මෙලොවට පැමිණ පව්කාරයන් ගළවා ගැනීමට තම ජීවිතය කුරුසය මතදි පූජා කොට ලෝකයට ඉගැන්වූයේද සැමවිටම දුර්වල් , පව්කාර අයට සමාව දෙමින් ඔවුන්ට උපකාර කරන්න කියායි. කිතුනුවන්ට දේවස්ථානය හා ඉතා කිට්ටු සම්බන්ධතාවයක් පවති. එබැවින් ඔවුහු යාච්නාවට ප්‍රධාන තැනක් තම ජීවිතයේදි වෙන් කරයි .

හින්දු දහමට වනහි ඉන්දියානු ආර්යය ජනතාවගෙන් පැවත එන්නකි . ඉන්දු නිම්න ආශ්‍රිතව ජනාවාස ඇති කරගත් ඔවුහු ඔවුන්ගේ ඇදහිලි හා විශ්වාස ආදියට තවත් වත් පිලිවෙත් එකතු කොට හින්ද් ආගම නිර්මාණය කරන ලද ඉතිහාසය ලිපි වල දැක්වේ. මේ තුල ස්වාභාවධර්ම වන්දනාව . මලගිය අය වන්දනා කිරීම හා ආත්මය , කර්මය , සංසාරය හා මෝක්ෂය ප්‍රධාන සංකල්ප ලෙස මෙම ආගමේ දැක්වේ . හින්දු භක්තිකයෙක් වීමට නම් හින්දු පවුලක පදීම අනිවාර්ය වන අතර එය අදට වලංගු වනවාදැයි විමසා බැලිය යුතුය. මේ දහම දැඩිව කුලභේදය තකන ආගමක් වුවත් දැඩිව පින් පව් ගැන තකයි . එබැවින් ඔවුන් තම දෙවියන්ට ප්‍රසන්න ලෙස ජීවත් වීමට පුරුදුව සිටි .

ක්‍රි.පු (7) වන සියවසේ පමණ මුහම්මද් නබි නායක තුමා ආරම්භ කළ ඉස්ලාම් ධර්මය තුල කිතුනු ආගම මෙන්ම විශ්වාසය හා ඇදහිම කරනුයේ එකම් දෙවි කෙනෙක් බවයි. මුස්ලිම් ජනතාව ඔවුන්ට කරන ලද ඉගැන්වීම අනුව ජීවත් වෙමින් අවශ්‍යතා ඇති අයට උදව කරමින් ද උපවාසය හා දවස්ට පස්වරක් යාච්නා කරමින්ද මෙලොව කල්ගත කරමින් ස්වර්ගයට පැමිණි කල අල්ලා දෙවියන්ගේ ආලෝකය දැක බලාගත හැකි බව ඔවුන්ගේ විශ්වාසයයි .

මම පලමුව සදහන් කල එඩ්වර්ඩ් නොබෙක්ගේ අර්ථකථනය දෙසට ආපසු හැරනු කල ඔහුට අනුව ආගම, අදහස් , විශ්වාස , ආකල්ප හා අධිශ්ඨාන බලවේගයන්ගේ ක්‍රියාදාමයක් ලෙස දක්වා ඇත . මෙලෙසින් අපට ආගම වනාහි මානවායාගේ හැසිරීම් පාලනයේ නියමුවා ලෙස දැක්විය හැක .මිනිසාගේ ශ්‍රද්ධාව හා භක්තිය වටා ගොඩනැගි ඇති ආගම බිය හා ගෞරවය වැනි හැගීම් වටාද බැඳි පවතින බව අපට පසක් වන කරුණකි. ආගමකින් ඉටුවන කාර්යයන් පිලිබද විමසා බැලිමේදි මෙයින් පලමු කොටම ආගමික අත්දැකිම ලබාදීම ගැන කතා කිරිමට ප්‍රථමයෙන් අදහස් කරමි. මෙය ආගමේ දැක්වෙන මූලිකම කාර්යය වන අතර එම අත්දැකිම සාරංශ කොට ගත හොත් වන්දනාමාන කිරිම , යාච්නාව භාවනාව වැනි දේ නිදසුන් ලෙස දැක්විය හැකිය. මෙයින් මිනිසා ගේ හැගීම් හා සාරධර්ම මෙන්ම ආකල්ප වර්ධනය කරයි . ආගම මගින් ඉටුවන අනෙක් කාර්යය ලෙස සාමකාමි මනසත් ඇති කිරිම දැක්වියය.සෑම මනුෂයෙකුගේම මානසික පීඩාවන් වලින් ඈත් කර සමාකාමි මනසක් ඇතිකර ගැනිම සදහා ආගම ඉවහල්වේ.එසේම පීඩාකාරි තත්වයන්ගේ සහනය මෙන්ම චරිතය හැඩගැස්විමද මේ තුලින් සිදු වේ . මනුෂ්‍ය ජීවිතයේ සම්ප්‍රදායික වර්ධනය කරලීමට පොදු ඇදහිම් ක්‍රමයක් මගින් සමූහිකත්වය වර්ධනය කිරිමද ආගම තුලින් සිදු කරන අතර ජීවිතයේ අර්ථවත් බව සුරකීමට හා සමාජ පාලන මාධ්‍යයක ලෙස ක්‍රියා කිරිමද ආගම තුලින් ඉටුවන කාර්යයන් ලෙස දැක්විය හැක.

ආගම හා විශ්වාසය තුල මානුෂීය ගුණාංග ඉටුවන් බවට නිදසුන් ලෙස පාස්කු ප්‍රහාරය ගැන දැක්වීමට රිසි වෙමි, මේ මා දකිනා විදිහ වන අතර එයා ,මාගේ මතයද වේ. මෙම සිදුවීම එකිනෙකා විවිධාකර වූ මත දරන සිද්ධියක් බව මම දනිමි. එදා සිදු වූ සිදු වීම දෙස බැලූ විට එය සිදුවූයේ ආගම් දෙකක් අතර මිස ජාතින් දෙකක් අතර නොවෙන බව අපි දන්නා කරුණකි.

මේ සිදුවීමට මූලිකව හේතු වී ඇත්තේ ආගම තුලින් කරන ඉගැන්වීම් මනුෂ්‍ය මට්ටමින් වටහා ගැනීමේදි වැරදියට අවබෝධ කරගෙන වෛර සිතුවිලි උපදවා ගෙන සිටිම තුලිනි. එනමුත් මා මේ සිදුවීමේදි ඉතාමත් ආකර්ශනය දිනාගත් සිදුවීම වනුයේ කිතුණු ජනතාව මුස්ලිම් ජනතාවට විරුද්ධව නැගී සිටිමට ගිය අවස්ථාවේ කාදිනල් හිමිපාණන් විසින් තම ජනතාවට කරුණු අවබෝධ කර දී ඔවුන්ට යථාතත්වයට පත් කල ආකාරයයි.එකෙක් අනෙකාව නසා තම දහමේ අභිවුර්දියේ තැකීමක් කලත් අනෙකා තමාට වූ හිරිහැර වලට සමාව දී සාමය පැතරවීම්ට උත්සහා කිරිමටත් මූලික වන්නේ ඔවුනගේ ආගම හා විශ්වාසයන් දැරීම බව මෙයින් පසක් නොවේද ?

මා මාගේ ජීවිතයේ ඉතා ආදරය කරන චරිතයක් වන ශුද්ධෝත්ම ෆැන්සිස් පියතුමා එක් මහා බ්‍රහස්පතින්දා දින පාද සේදීමේ චාරත්‍රයක් අනතුරුව කියා සිටියේ ජේසුගේ ගෝලයක් වීමට ආගම් බේද අනවශ්‍ය බවත් ජේසුගේ ගෝලයෙක් වීමට අයිතිය අප හැමෝටම තියෙනවා යන්න එතුමා අවධාරනය කර සිටියා . මගේ ජීවිතයේ පරමාදර්ශී චරිතයක් වූ ඔහු තුල ඉවසීම, සමාවදීම හා විශ්වාසය යන මානුෂීය ගුණාංග සැමදේම පාහේ කැටිව තිබෙන බව අප සැමට පෙනෙනා කරුණකි. මෙයින් පිලිබිඹු වන්නේ ආගම හා විශ්වාසයන් දැරීමේ ප්‍රතිඵලය නොවිද ?

මේ වසංගත සමයේ අප අත් දැකපු මානුෂීය ගුණාංග ඉතාමත් මොනවට පිලිබිඹු වූ අවස්ථා අසන්නට දකින්නට අපිට නිතරම ලැබුණි. ඇදිරි නීත් සමයේ අවශ්‍යතා ඇති අයට උදව් උපකාර කිරීමට පෙලඹීම තුල මෙන්ම වෛරසයකට මිනිසාව සාරධර්ම හා යහපත් ආකල්ප වලින් ඇද බැද තබා ගැනීමට නොහැකි බවද අප උගත් පාඩම් වේ.

එහෙයින් යම්කිසි ආගමක් හෝ විශ්වාසයක් තුලින් මිනිසාව පුරුදු පුහුණු කරනුයේ එකිනෙකට සමාව දෙමින් තමන්ට වරද කරන අයට ඉවසමින් හා තමා දරන්නා වූ යහපත් මතයන් ගැන විශ්වාස කරමින් තමා තුල උතුම් වූ මෙම මානුෂීය ගුණාංග වර්ධනයට කල යුතු බව හා එම මානුෂිය ගුණාංග උදෙසා යම් කිසි ආගමක් හෝ විශ්වාසයක් දැරීමේ නිදහස පුද්ගලෙකුට තිබිය යුතු බවත් එය බලෙන් කරවීමට කිසිවෙකුට නොහැකි බවත්ය .

ජී.ඒ.එල්.එස්.ඒ. ද සිල්වා
G.A.L.S.A. De Silva
lakshiruth36@gmail.com
Tp- 0764229630
28 years ( 1993.08.24)